# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/5 - 2017 සැප්තැම්බර් මස 20 වැනි බදාදා - 2017.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

3 වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, (මෙම උප ලේඛනයේ I සහ II හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ දැනටමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයන් හැර) මෙහි I හා II වන තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ එම උපලේඛනයේ II වන තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් සහ ඉම් සලකුණු, නිශ්චිතව දක්වා ඇත්තා වූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක,<br>
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,<br>
17 සහ 18 වන මහල, ''සුහුරුපාය'',<br>
සුභූතිපුර පාර,<br>
බත්තරමුල්ල,<br>
2017 සැප්තැම්බර් මස 15 වැනි දින.

උපලේඛනය I

***අළුත් එළුවන්කුලම සහ සේරක්කුලිය ග්‍රාම නිලධාරී වසම් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම***

*I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍ර* අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ අංක 38/16 හා 1979.06.01 දින දරන පුත්තලම නගර සභා බල ප්‍රදේශය ද, අංක 100/4 හා 1980.08.04 දින දරන හලාවත නගර සභා බල ප්‍රදේශය ද, අංක 451/8 හා 1987.04.28 දින දරන ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 462/8,

*II වන තීරුව*

*උතුරට* :

පරණ එළුවන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි උතුරු සහ බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට කලපුවෙහි නැගෙනහිර මායිමෙහි කිලෝමීටර් 11.7 දකුණුදෙසට වන්නට හමුවන්නා වූ ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට පරණ එළුවන්කුලම ග්‍රාම නිලධාරි



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

*I වන තීරුව*

1148/5 හා 1987.07.14, 2000.09.04 දින දරන වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 462/8 හා 1987.07.14 දින දරන දංකොටුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 1025/9 හා 1998.04.29 දින දරන මාදම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 1314/20 හා 2003.11.14 දින දරන නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 1559/43 හා 2008.07.25 දින දරන පුත්තලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අංක 1564/9 හා 2008.08.27 දින දරන කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (කොටසක්) ද, අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II තීරුව*

කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ ගිනිකොණ, දකුණ, ගිනිකොණ, නිරිත, ගිනිකොණ, ඊසාන, ගිනිකොණ, නිරිත සහ දකුණු දිසා ඔස්සේ ගමන් කර, පරණ එළුවන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි දකුණු මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, පරණ එළුවන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි දකුණු මායිම් ඔස්සේ නැගෙනහිර, ඊසාන, ගිනිකොණ, ඊසාන, ගිනිකොණ, ඊසාන, ගිනිකොණ, ඊසාන හා ගිනිකොණ දිසා ඔස්සේ ගමන් කොට පරණ එළුවන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි නැගෙනහිර මායිම් සහ රල්මඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට රල්මඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම් ඔස්සේ නිරිත දෙසට ගමන් කර, මන්ගලපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, මන්ගලපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම් ඔස්සේ බටහිර දෙසට ගමන් කර මන්ගලපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, මන්ගලපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණ, නිරිත හා දකුණු දෙසට ගමන් කර කරතිවු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ නැගෙනහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*දකුණ :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කරතිවු දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර, වයඹ, බටහිර, වයඹ, නිරිත සහ වයඹ දෙසට ගමන් කර කරතිවු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර සහ දකුණු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, කරතිවු උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ උතුර, වයඹ හා බටහිර දෙසට ගමන් කර කලපුවෙහි නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට, කලපුවෙහි නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, දකුණ සහ වයඹ දෙසට කිලෝමීටර් දෙකක් දුර දක්වා ද වේ.

*බටහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කලපුවෙහි නැගෙනහිර මායිම ඔස්සේ ඊසාන, වයඹ සහ ඊසාන දිශාවන්ට ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

10-59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.